# බ්‍රිතාන්‍යය යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවේ අලි ඇතුන් ඇල්ලීම, දඩයම හා වෙළෙඳාම

ඩබ්ලිව්.එම්. හිරාන් මධුසංක *

මානවයා ශිෂ්ට සම්පන්න දිවියකට හුරුවූ පසුව නොයෙකුත් වන සතුන් හීලෑ කිරීම නැතහොත් ගෘහස්ථකරණය මගින් තමන්ගේ කාර්යන් පහසුවෙන් ඉටුකර ගන්නට පෙළඹිණි. එහි මුල්ම නැතහොත් ප්‍රාථමික අවස්ථාව නියෝජනය කරන්නේ සුනඛයා විසින් වුවත් පසුකාලීනව ඊට බොහෝ සත්තු එක් වූහ. ඒ අතර හස්තියාට හිමිවන්නේ සුවිශේෂී ම වූ ස්ථානයකි. යුද අවස්ථා වෙනුවෙන් ද වෙළෙඳාම පිණිස හා ප්‍රවාහන කටයුතු වෙනුවෙන් යොදාගැනීම අලි ඇතුන්ගෙන් වූ මූලික ප්‍රතිලාභයන් ය. ශ්‍රී ලංකාවේ අලි ඇතුන් සතුව තිබූ සුවිශේෂිතා හේතුවෙන් විදේශ වෙළෙදාමේදී ශ්‍රී ලංකාවේ ඊට ඉහළ මිලක් නියම විය. යටත් විජිත යුගවලදී ආසියා, යුරෝපා රටවල් සඳහා ශ්‍රී ලංකාවෙන් අලි ඇතුන් විශාල වශයෙන් අලෙවි කරන ලදී. පෘතුගීසී, ලන්දේසී මෙන් ම විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ දී අලි ඇතුන් වෙළෙඳාම සිදු කෙරුනේ එය ඉතා ලාභදායි ආදායම් මාර්ගයක් වූ නිසාය. රාජාණ්ඩු සමයේ සිටම අලි ඇතුන් ඇල්ලීම, විකිණීම සම්බන්ධයෙන් සුවිශේෂී කාර්යංශයක් මෙරට ක්‍රියාත්මක වූ අතර එය කුරුවේ බද්ද නමින් හැඳින්විය. බ්‍රිතාන්‍යයෝ එය තව දුරටත් පවත්වාගෙන ආ අතර අලි ඇතුන් ඇල්ලීම සම්බන්ධයෙන් විශේෂ ප්‍රාගුණ්‍ය සහිත වූ ජන කොට්ඨාසය මට්ටයින්, පණික්කියන් යනුවෙන් හඳුන්වන ලදී. ඇත් ගාල් ක්‍රමයද අලි ඇතුන් ඇල්ලීම සඳහා භාවිත කළ ජනප්‍රිය ක්‍රමයකි. අලි ඇතුන් දඩයම් කිරීම බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ නිලධාරීන්ගේ හා වැවිලිකරුවන්ගේ ක්‍රීඩාවක් බවට පත් වී තිබුණි. බ්‍රිතාන්‍ය නිලධාරියෙක්, දඩයම්කරුවෙක් වූ මේජර් රොජර් නැමැත්තා අලි ඇතුන් දඩයමේ කෙල පැමිණියෙක් ලෙස ප්‍රසිද්ධය. මෙසේ බ්‍රිතාන්‍ය යුගයේ අලි ඇතුන් ඇල්ලීම, වෙළෙඳාම හා දඩයම පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

මෙහි පර්යේෂණ ක්‍රමවේදය ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනයයි. ඒ සඳහා මේ යුගය පිළිබඳ තොරතුරු සපයන නොක්ස්ගේ එදා හෙළදිව, ඩේවි දුටු ලංකාව, ස්කිනර්ගේ ලංකාවේ පනස් වසක්, ප්ලීතියස් දුටු ලංකාව, හෙන්රි මාෂල්ගේ සිංහලේ හා රොබට් පර්සිවෙල් දුටු ලංකාව යන කෘති අධ්‍යයනය කරනු ලබයි.

**මුඛ්‍ය පද . වෙළෙඳාම, ඇත් ගාල, දඩයම, අලි ඇතුන් ඇල්ලීම, ආදායම**

---

*** පර්යේෂණ සහකාර, පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය, සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.**